කඩිනම් නිවේදනයයි!

2025 ඔක්තෝබර් 01

2025 ආසියානු පැසිෆික් මෝටර් රථ ක්‍රීඩා ශූරතාවලිය ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකාව තුළදී පැවැත්වුණා.

2025 සැප්තැම්බර් 26 සිට 28 දක්වා කාලය තුළ පැවති ආසියානු පැසිෆික් මෝටර් රථ ක්‍රීඩා ශූරතාවලිය (APMC) ශ්‍රී ලංකාවේ බණ්ඩාරගම ස්පීඩ්බේ පරිපථයේදී සාර්ථකව නිමාවක් සනිටුහන් කළ අතර, කලාපය පුරා රටවල් 17 කින් තරඟකරුවන් 210 ක් ඊට එක් විය.

කාර්ටින්, ඔටෝක්‍රොස්, ඊ-ක්‍රොස්පෝර්ට්ස් සහ ජිම්කානා යන අංශ හරහා පැවති උද්‍යෝගිමත් සති අන්ත තරඟයකින් පසු, පිලිපීනය සමස්ත ශූරයන් ලෙස ජයග්‍රහණය හිමි කරගත් අතර, ශ්‍රී ලංකාව දෙවන ස්ථානය ද, චීනයේ හොංකොං තෙවන ස්ථානයද දිනාගන්නා ලදි.

මෙම තරගාවලියේදී ඉතිහාසයේ පළමු වතාවට වාර්ථා වූ ඓතිහාසික අවස්ථා කිහිපයක් විය: FIA හි ක්‍රොස් කාර් මූලපිරීම යටතේ දේශීයව නිර්මාණය කරන ලද FIA ක්‍රොස් කාර් එළිදැක්වීම; කලාපයේ ප්‍රථම ක්‍රොස් කාර් ඉසව්ව; 4-ස්ට්‍රෝක් කාර්ටින් එන්ඩියුරන්ස් හි මංගල දර්ශනය; සහ දේශීයව එකලස් කරන ලද හුන්ඩායි ග්‍රෑන්ඩ් i10 භාවිතා කරමින් සිදුවූ ඔටෝ ජිම්කානා ධාවනය එම අවස්ථායි.

මේ අතර, නැවත කාර්ටින් ස්ප්‍රින්ට් අංගය තරඟාවලියට නැවත ඇතුළත් වූ අතර, එමගින් කැඩෙට්, ජූනියර් සහ ජ්‍යෙෂ්ඨ කාණ්ඩ හරහා කලාපයේ හොඳම දක්ෂතා ඇති තරඟකරුවන් ධාවන පථවලට පිවිසිණි. මේ අතර, ධාවකයාගේ තීක්ෂණ බව, නිරවද්‍යතාව සහ වේගය පරීක්ෂා කෙරෙන දුෂ්කර සහ සංකීර්ණ තරඟ අංගයක් වූ කාර්ටින් ස්ලාලොම් අංශයෙන් තරඟ වැදීමට කලාපීය තරඟකරුවන් 40 කට අධික සංඛ්‍යාවක් එක්විය.

eSports කාණ්ඩයේ ජයග්‍රාහකයින්ට ප්‍රමිතියෙන් උසස්ම F-GT Lite රේසිං ධාවන පැලදුම් කට්ටල හිමිවූ අතර, බිම් මට්ටමේ මෝටර් රථ ක්‍රීඩාව සංවර්ධනය කිරීමේදී වර්චුවල් ධාවන තරඟවල වර්ධනයේ වැදගත්කම මෙහිදී ඉස්මතු විය. මෙම උත්සවය සංවිධානය කරන ලද්දේ Fédération ¸nternationale de l’Automobile (FIA) හි සාමාජිකයෙකු වන සිලෝන් මෝටර් ක්‍රීඩා සමාජය (CMSC) විසිනි.

පදක්කම් සටහන (ප්‍රමුඛ ත්‍රිත්වය)

- පිලිපීනය - රන් 2, රිදී 2, ලෝකඩ 2 (සමස්ථ 6)
- ශ්‍රී ලංකාව - රන් 2, රිදී 2, ලෝකඩ 1 (සමස්ථ 5)
- හොංකොං, චීනය - රන් 2, රිදී 1, ලෝකඩ 2 (සමස්ථ 5)

පෝඩියම් ප්‍රතිඵලවල විශේෂ අවස්ථා

● ක්‍රොස් කාර් ඔටෝක්‍රොස්: රන් - අෂාන් සිල්වා (ශ්‍රී ලංකාව), රිදී - රිකාඩෝ එන්රික් මොන්ටෙලිබානෝ (පිලිපීනය), ලෝකඩ - මොහොමඩ් ෂාෆික් බින් සම්සුදින් (මැලේසියාව)

● ඔටෝ ජිම්කානා (පිරිමි): රන් - අෂිෂ් භාරතී (ඉන්දියාව), රිදී - කුම් යාඕ සෙන්ග් (චීන තායිපේ), ලෝකඩ - රිචඩ් ගැලාර්ඩෝ (පිලිපීනය)

● ඔටෝ ජිම්කානා (කාන්තා): රන් - කොරින් ඊස්ට් ජොන්ස්ටන් (ඕස්ට්‍රේලියාව), රිදී - තරුෂි වික්‍රම් (ඉන්දියාව), ලෝකඩ - ඩිනා මුබමෙට්සියානෝවා (කසකස්තානය)

● කාර්ටින් එන්ඩියුරන්ස් (කණ්ඩායම): රන් - කිර්ගිස්තානය, රිදී - පකිස්ථානය, ලෝකඩ - උස්බෙකිස්තානය

● කාර්ටින් ස්ලාලොම් (කනිෂ්ඨ): රන් - එවන් සමරජීවා (ශ්‍රී ලංකාව), රිදී - සොෆියා සාරා බින්ටි මුස්තාෆා කමල් (මැලේසියාව), ලෝකඩ - ෂෙනුකා නිතින් විජයසේකර (ශ්‍රී ලංකාව)

● කාර්ටින් ස්ලාලොම් (ජ්‍යෙෂ්ඨ): රන් - කාලෝස් ඉනිගෝ ඇන්ටන් (පිලිපීනය), රිදී - යූ ක්වාන් (චීන තායිපේ), ලෝකඩ - චෙන් ෂුවාන් වූ (චීන තායිපේ)

● කාර්ටින් ස්ප්‍රින්ට් (කැඩෙට්): රන් - මේසන් ඇලෙක්සැන්ඩර් (හොංකොං, චීනය), රිදී - කාර්සන් චෝයි (හොංකොං, චීනය), ලෝකඩ - සුම් මේයි ඇලිස් ලෝ (හොංකොං, චීනය)

● කාර්ටින් ස්ප්‍රින්ට් (කනිෂ්ඨ): රන් - ඇක්සෙල් නොකොම් (පිලිපීනය), රිදී - ටෙහාන් අමරසිරි (ශ්‍රී ලංකාව), ලෝකඩ - හියුංගි මින් (දකුණු කොරියාව)

● කාර්ටින් ස්ප්‍රින්ට් (ජ්‍යෙෂ්ඨ): රන් - යූ කා පෝ (හොංකොං, චීනය), රිදී - ඇරන් ඩීන් (ඉන්දියාව), ලෝකඩ - සරිෆ් චක්රා (මැලේසියාව)

● eSports iRacing: රන් - සෝටා මුටෝ (ජපානය), රිදී - නබිල් අසාලන් (මැලේසියාව), ලෝකඩ - රසල් රෙයිස් (පිලිපීනය)

● eSports Assetto Corsa: රන් - නැක්විඩ් අසියන් (මැලේසියාව), රිදී - ලුයිස් මොරෙනෝ (පිලිපීනය), ලෝකඩ - යිම් චිං කිට් (හොංකොං, චීනය)

තරඟාවලි සමාප්ති උත්සවයේදී අදහස් දක්වමින්, FIA ක්‍රීඩා පිළිබඳ මහලේකම් වැලෙරියෝ ඉවිසි මෙසේ පැවසීය:

"දැඩි තරඟකාරීත්වයක් සහ එඩිරිවාදිකම් සමග එය දැඩි අභියෝගාත්මක ලෙස ක්‍රියාත්මක වූ නමුත් එයටත් වඩා මට ඉස්මතු කිරීමට අවශ්‍ය වන්නේ මේ තරඟාවලිය පුරා ඔබ සොඳුරු මතකයන් සහ මිත්‍රත්වයන් නිර්මාණය කර ඇති බවත්, එම මතක ඔබ ඔගේ ඉතිරි මුළු ජීවිත කාලය පුරාම රැගෙන යනු ඇති බවත්ය. සිලෝන් මෝටර් ස්පෝර්ට්ස් සමාජයේ (CMSC) දැවැන්ත කාර්යය භාරය වෙනුවෙන් මේ පිළිගැනීම ලබාදීමත් සමස්ත සංවිධානයටම ස්තූති කිරීමත් මේ මොහොතේ මට වැදගත්ය. FIA හි සභාපතිවරයා වෙනුවෙන්, මම, මෙම තරඟාවලිය සඳහා බොහෝ කාලයක් හා වෑයමක් දැරූ ක්‍රියාකාරී කණ්ඩායම් ඇතුළු සියලු දෙනාට මගේ උණුසුම් ස්තූතිවන්තභාවය පුද කරමි. සමස්ත සම්මේලනය, කාර්ය මණ්ඩලය සහ මේ හා සම්බන්ධ වූ සැම මෙහිදී නියෝජනය කරන්නට ලැබීම මට සැබෑ ගෞරවයකි. ඔබ සැමට සුබ පැතුම්."

මෙම තරඟාවලිය සඳහා අනුග්‍රාහකත්වය දැක්වූ පාර්ශවකරුවන් වන්නේ: නිල මෝටර් රථ සහකරු ලෙස හුන්ඩායි අබාන්ස් ඔටෝ, ජිම්කානා ටයර් සහකරු ලෙස වෙස්ට්ලේක් ටයර්, සංවිධාන සහ සම්බන්ධීකරණ සහකරු ලෙස ඊස්ට්වින්ඩ් ලොජිස්ටික්ස්, ඊස්පෝර්ට්ස් නාම අනුග්‍රාහකයා වශයෙන් නෙක්ස්ට් ලෙවල් රේසිං, තාක්ෂණික සහකරු ලෙස චාමා කම්පියුටර්ස්, නිල තේ සහකරු ලෙස අක්බාර් තේ සහ නිල ආවරණ සහකරු ලෙස මෙගුයර්ස් ය.